# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

**ප්‍රථම පරීක්ෂණය ( බාහිර ) - 2007**

**BMGT E 1015/ BMG 102.1 – කළමනාකරණ මූලධර්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

**පළමුවන ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්ණ පහකට (05) පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් සිද්ධිය කියවා අවසානයෙහි අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### වතු කළමනාකරණය

ලංකාවේ ප්‍රධාන වගාවක් ව්‍යාප්ත කිරීමේ කටයුතු පැවරී තිබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයක කළමනාකාර අධ්‍යක්ෂවරයා, විසින් වතු කළමනාකරණ අංශයේ කළමනාකාරවරයාත්, වතු අධිකාරීවරුනුත් සාකච්ජාවක් සඳහා කැඳවන ලද්දේ වසර දෙකකට පෙර රජය විසින් පවරන ලද වතුවල ප්‍රගතිය පිළිබඳව සාකච්ජා කිරීම සඳහාය. රජය විසින් එම වතු පවරන ලද්දේ එහි වගාව සඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිණිසය.

කළමනාකාර අධ්‍යක්ෂවරයා කළ විමසීමකට පිළිතුරු වශයෙන් වතු කළමනාකරණ අංශයේ කළමනාකාරවරයා කියා සිටියේ තමාගේ මතකයට අනුව අක්කර 10,000 ක පමණ ඉඩම් ප්‍රමාණයක් තම අංශයට රජයෙන් පවරන ලද බව සහ එහි වගා කටයුතු ඉතාමත්ම සතුටුදායක මට්ටමකින් පවත්වාගෙන යනු ලබන බවය. පොල් ඵලදාව සහ ගම්මිරිස්, කෙසෙල් සහ කුරුඳු වැනි අතුරු බෝගවල ඵලදාව සම්බන්ධයෙන් වූ ප්‍රගතිය ඒ ඒ භෝග අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන ලෙස කළමනාකාර අධ්‍යක්ෂවරයා කළ ඉල්ලීමට අනුව කළමනාකාර (වතු කළමනාකරණ) මෙහි පහත දැක්වෙන කරුණු පැහැදිලි කරන ලදී.

I පොල් ඵලදාව බොහෝ දුරට දේශගුණික තත්ත්වයත් පොහොර කිරීමත් මත රඳා පවතින අතර ඉදිරි වර්ෂ කිහිපය තුළදී පොල් ඵලදාව වැඩි කිරීමට හැකිවනු ඇත.

II අතුරු බෝග පලදාව පිළිබඳ විස්තර ප්‍රධාන කාර්යාලයෙහි නොමැති අතර ඒවා එක් එක් වත්තෙහි වතු අධිකාරී වෙතින් ලබා ගැනීමට හැකිය.

III කළමනාකාර (වතු කළමනාකරණ) විසින් තවදුරටත් දන්වා සිටියේ සෑම අතුරු බෝගයක් සම්බන්ධයෙන්ම ඉතාමත් සතුටුදායක ඵලදා මට්ටමක් පවත්වා ගන්නා බව ඔහු ඉතා හොඳින් දැන සිටින බවය.

ඵලදා ඉලක්ක සපුරාගෙන තිබේදැයි කළමනාකාර අධ්‍යක්ෂවරයා විමසා සිටියේය. වසරෙන් වසර ඵලදාව වැඩි කිරීම ඔහුගේ ඉලක්කය බව කළමනාකාර (වතු කළමනාකරන) ප්‍රකාශ කලේය. ඉලක්ක සපුරාගැනීම ගණනය කරන්නේ (අගයන්නේ) කෙසේද යන්න සම්බන්ධයෙන් කළ විමසීමට පිළිතුරු වශයෙන් ඔහු ප්‍රකාශ කර සිටියේ ඒ සඳහා අනුගමනය කළ හැකි එකම ක්‍රමය වන්නේ පවත්නා වර්පයෙහි ඵලදාව පසුගිය වර්පයේ ඵලදාව සමග සංසන්දනය කර බැලීම බවයි.

එක් එක් වත්තෙහි ප්‍රගතිය පැහැදිලි කරන ලෙස කරන ලද දැන්වීම අනුව වතු අධිකාරීවරුන් සියළුම දෙනා දැක්වූ අදහස් සංක්ෂිප්තව මෙහි පහත දක්වා ඇත.

I පොල් වගාව සහ අතුරු බෝග වගාව සම්බන්ධයෙන් ඔවුන් ලබාගෙන ඇති දිර්ඝකාලීන අත්දැකීම් ප්‍රයෝජනයට ගෙන සෑම වගාවකම ඵලදාව ඉහල නැංවීම සඳහා තමන්ගේ උපරිම දායකත්වය ලබාදෙන බව ඕව්හු සඳහන් කළහ.

II වගා කටයුතු සම්බන්ධයෙන් ඔවුන් ස්වාධීන තීරණ ගන්නා අතර එහිදී වෙනත් අයගේ අදහස් ලබාගැනීමේ අවශ්‍යතාවයක් මතු නොවේ.

මාසයකට වරක් හෝ තෙමසකට වරක් කළමනාකරණයට සබැඳි කටයුතු පිළිබඳව සාකච්ජා පැවැත්වීම පිණිස රැස්වීම් පැවැත්වෙන්නේ ද යන්නත් භාවිතාවක් වශයෙන් ප්‍රගති වාර්තා ප්‍රධාන කාර්යාලයට එවන්නේ ද යන්නත් පිළිබඳව විමසීමක් කරන ලදි. වතු අධිකාරීවරුන් කියා සිටියේ කළමනාකරණ (වතු) වෙත නිතරම දුරකථනයෙන් අමතන නිසාත් ඉතා අඩුම වශයෙන් මසකට දෙවරක්වත් ඔහු සෑම වත්තක්ම පරීක්ෂාකර බැලීම සඳහා පැමිණෙන නිසාත් එවැනි රැස්වීම් පැවැත්වීමේ හෝ ප්‍රගති වාර්තා ප්‍රධාන කාර්යාලයට එවීමේ අවශ්‍යතාවයක් මතුවී නොමැති බවයි.

බීජ පොල් පැල සිටුවීම සම්බන්ධයෙන් පැහැදිලි කළ වතු අධිකාරීවරුන් කියා සිටියේ ඒවා සපයා ගැනීම පිණිස ඔවුන් සෑම අයකු විසින්ම වැඩ පිළිවෙලක් සකස් කරගෙන ඇති බවයි. මෙම ආයතනය මගින් නඩත්තු කරන පොල් පැල තවාන්වල පර්යේපන පදනම් කරගෙන නිප්පාදනය කරනු ලැබූ හොඳ වර්ගයේ දෙමුහුන් පොල් පැල තිබෙන බැව් කළමනාකාර අධ්‍යක්ෂවරයා සඳහන් කලේය. වතු අධිාරීවරුන් මෙම තොරතුරු දැනගෙන සිටියේ නැත.

මෙම සාකච්ජාවේදී පැහැදිලි වූ කරුණු පිළිබඳව කළමනාකාර අධ්‍යක්ෂ සෑහීමකට පත්වූයේ නැත. කළමනාකරණ උපදේශකයකු වශයෙන් එම සාකච්ජාවට සහභාගී වී සිටි සිරිනිමල් වෙත කළමනාකාර අධ්‍යක්ෂවරයා දන්වා සිටියේ වතු කළමනාකරණ අංශයේ මතුවී ඇති කළමනාකරණ ගැටළු ද ඒවා සඵලදායී ලෙස විසඳීම සඳහා කරන නිර්දේශයන් ද සඳහන් කරමින් තමා වෙත මූලික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසය.

(අ) කළමනාකරණ මූලධර්ම හා සංකල්ප පිළිබඳව මනා දැනුමක් ඇති කළමණාකරන උපදේශකවරයෙකු වශයෙන් ඉහත සඳහන් සාකච්ඡාවට සහභාගී වූයේ නම් ඔබ විසින් හඳුනාගන්නා කළමණාකරන ගැටළු මොනවාදැයි එකී මූලධර්ම හා සංකල්ප ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(ආ) හඳුනාගත් කළමනාකරණ ගැටළු විසඳීම සඳහා ඔබ කරන නිර්දේශ කළමනාකරණ මූලධර්මවල අන්තර්ගත න්‍යායාත්මක සංකල්ප යොදාගනිමින් විස්තර කරන්න.

(ලකුණු 18 යි)

(02) (අ) කළමනාකරණය පිළිබඳ පොදු පරිපාලන න්‍යායන් (General Administrative Theories of Management) සඳහා මැක්ස් වෙබර් (Max Webber) විසින් දායක වී ඇති ආකාරයත්, (ආ) කළමනාකරණ කටයුතු සඳහා නිලතන්ත්‍රවාදය (bureaucracy) යොදාගැනීමෙහි ඇති වැදගත්කමත් නූතන කළමනාකරණ චින්තනය තුළ මෙම සංකල්පයට විරුද්ධව ඇති විවේචනත් විස්තර කරන්න.

(ලකුණු 18 යි)

(03) "සංවිධාන ස්වකීය පරිසරයට අනුගතවීම සඳහා යොදා ගන්නා විවිධ වූ යාන්ත්‍රන ඇත. කෙසේ වුවද සංවිධාන, පරිසරයන් ඉදිරියෙහි කිසිඳු පිළිසරණක් නැති තත්ත්වයට පත් නොවේ. සැබවින්ම බොහෝ සංවිධාන විවධ වූ ක්‍රියාමාර්ග තුළින් ස්වකීය පරිසරයන්ට සෘජු බලපෑම් කිරීමට සමත්වී සිටිති."

(අ) පරිසරයට අනුගතවීම සඳහා සාමාන්‍යයෙන් සංවිධාන යොදා ගන්නා යාන්ත්‍රන මොනවාද?

(ලකුණු 06 යි)

(ආ) සංවිධානයකට එහි පරිසරයට සෘජුවම බලපෑ. ඒ කිරීමට හැකිවන විවිධ වූ ක්‍රියාමාර්ග මොනවාදැයි ප්‍රායෝගික උදාහරණ උපුටා දක්වමින් විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

(04) "කළමනාකරණ තීරණ ගනු ලබන්නේ තාර්කික ලෙස යැයි සැලකේ. තාර්කික ලෙස කළමනාකරණ තීරණ ගැනීම යනු තීරණයක් ගැනීම සඳහා මග පෙන්වීමක් කරන ක්‍රමානුකූල සහ විශ්ලේෂණාත්මක ප්‍රවේශයකි."

(අ) තීරණයක් යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

(ලකුණු 05 යි)

(ආ) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ගත යුතු පියවර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(ඇ) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි පළමුවන පියවර විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

(05) (අ) "සමායෝජනය" (Co-ordination) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04 යි)

(ආ) කළමනාකරණ කාර්යයන් අතුරින් සංවිධානය කිරීමේ කාර්යය සඳහා සමායෝජනය අවශ්‍යය වන්නේ ඇයි.

(ලකුණු 05 යි)

(ඇ) සමායෝජනය සඳහා යොදාගත හැකි ශිල්පීය ක්‍රම තුනක් විස්තර කරන්න.

(ලකුණු 09 යි)

(06) "රැකියා විස්තාරනය (Job Enlargment) සහ රැකියා පෝෂණය (Job enrichment) සඳහා බොහෝදුරට පදනම් වී ඇත්තේ හර්බර්ග්ගේ ද්වි සාධක න්‍යායයි (Herzberg's Motivation – Hygiene theory). අභිප්‍රේරණය වන පරිදි රැකියා නිර්මාණය කිරීම සඳහා කළමනාකරුවන්ට මගපෙන්වීමේ සංකල්පමය රාමුව සපයා ඇත්තේ අභිප්‍රේරණය පිළිබඳ රැකියා ගති ලක්ෂණ ආකෘතියයි (Job Characteristic Model of Motivation)". මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් විවේචනාත්මක ඇගැයීමක් කරන්න.

(ලකුණු 18 යි)

(07) "සමාජීය වගකීම ඉටු කළ යුත්තේ කෙසේද යන්න කළමනාකරණය විසින් ඊට ප්‍රවේශවන ආකාරය අනුව තීරණය කළ යුත්තකි."

මෙහි පහත දැක්වෙන ප්‍රවෘත්ති පත්‍ර වාර්තාව කෙරෙහි අවධානය යොමු කරමින් සහ "සමාජීය වගකීම" හා සබැඳි න්‍යායාත්මක සංකල්ප මත පදනම්වූ විවිධ ප්‍රවේශ විස්තර කරමින් මෙහි ඉහත සඳහන් ප්‍රකාශයෙහි ඇති වලංගුභාවය පිළිබඳව සාකච්ඡා කරන්න.

<u>ප්‍රවෘත්ති පත්‍ර වාර්තාව</u> (2008.03.14 දින අයිලන්ඩ් පුවත් පතෙහි මූල්‍ය සමාලෝචනය පිළිබඳ ප්‍රවෘත්තිවලින් උපුටා ගන්නා ලදී.)

"දෘශ්‍යාබාධිතයින්ට විශාලතම දායකත්වය සපයා ඇත්තේ "ඔරේන්ජ් ඉලෙක්ට්‍රික් ලයිටින්" සමාගමයි. දෘශ්‍යාබාධිතයින්ට පෙනීම ලබාදීම සඳහා ඔරේන්ජ් ඉලෙක්ට්‍රික් ලයිටින් සාමාගම 2006 වර්ෂයේ සිට රුපියල් දශලක්ෂ විස්සකට වැඩි මුදල් ප්‍රමාණයකින් ආධාර කර ඇත. සමස්ත සමාජීය වගකීම සඳහා දායකවීමේ වැඩසටහන තුළින් මෙරට පෙනීම ලැබීම අත්‍යාවශ්‍යව සිටි පුරවැසියන් දහසකට වැඩි පිරිසකට පෙනුම ලබාදීම සඳහා මෙම සමාගම මහත් වූ දායකත්වයක් සපයා ඇත."

(ලකුණු 18 යි)